# මව්කුස වෙත ගන්ධබ්බයකුගේ ආගමනය සිදුවන අවස්ථාව

මිනිසුන් වශයෙන් ඉපදෙන සැමදෙනා විසින් ම වටහා ගත යුතු සුවිශේෂී කරුණක් ලෙස උපත යන්න සඳහන් කරමි. අප සම්මුතියෙහි සිට කරුණු ඉදිරිපත් කරන විට උපත වශයෙන් අප පිළිගනු ලබන්නේ මවගේ කුසින් බිහි වූ දිනය යි. ඇතැම් විට නවීන වෛද්‍ය විද්‍යාවේ දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික උපත් වළක්වා වේදනාවෙන් තොරව දරුවන් බිහි කිරීමට බොහෝ අය උත්සුක වෙති. එය සානුකම්පිතව ඉවසිය යුත්තකි. එනමුත් උපත සිදුවන වේලා සලකා නැකැත් ශාස්ත්‍රය අනුව යමෙකුගේ දෛවය තීරණය කළ හැකි නිසා සුදුසු නැකතකට අනුව දරුවාට කෘතිමව උපතක් ලබා දීමට මව්වරු මෙන් ම පියවරු ද වෙහෙසෙන බව අසන්නට ලැබීම නොඉවසිය හැකි ය.

අපගේ වයස මවගෙන් බිහි වූ දින සිට ගණනය කෙරුණ ද අප මිනිස් ලොවට පැමිණෙන්නේ ඊට මාස නවයකට දහයකට පමණ පෙර ය. එනිසා මව්කුස තුළ ජීවත්වන කාලය ඉතා වැදගත් වේ. ඊට හේතුව නම් එම කාලය තුළ මවගේ මෙන් ම පියාගේ ද කායික හා වාචසික ක්‍රියා කලාපයන් සිතුම් පැතුම් දරුවාට බලපවත්වන හෙයිනි.

සිද්ධාර්ථ කුමාරෝත්පත්තියට පෙරාතුව මහාමයා දේවිය දරුවෙකු අපේක්ෂාවෙන් නිතර පින් දහම්හි නිරත වූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එසේ ම වසර ගණනාවක් දරු සම්පත් නොලබා සිටි විහාරමහාදේවිය පන්සලේ මරණමඤ්චකයෙහි වැඩ සිටි පුංචි සාමණේර හිමි නමකට තමාගේ කුසෙහි පිළිසිඳ ගන්නා ලෙස ආරාධනා කරන ලදි. ඉන් අනතුරුව ඇය නිරතුරු පින් දහම්හි නියැලුණු බවත් ඒ අතරතුර එම සාමණේර හිමි අපවත්ව ඇය කුස පිළිසිඳගන්නා ලද බවත් එසේ පිළිසිඳ ගන්නා ලද්දේ දුටුගැමුණු කුමාරයා බව මහා වංශයෙහි සඳහන් වේ.

මේ අනුව පැහැදිලි වන්නේ යහපත් දරු උපතක් සිදුවුණු බොහෝ අවස්ථාවන්හි එය සිදු වී ඇත්තේ මවගේ අපේක්ෂාවක් ඇතිව බවයි. එනිසා මව වෙන් ම පියා ද දරු උපතක් අපේක්ෂාවෙන් කටයුතු කරන්නේ නම් යහපත් දරුවකු පිළිසිඳ ගනී යන්න සිදුවන්නකි. නමුත් බොහෝ විට සිදුවන්නේ මවත් පියාත් අපේක්ෂා නොකළ ගැබ්ගැනීමක් සිදුවීම යි. එවිට ඇති වන්නේ ශෝකයකි. එම ශෝකය මව්කුස පිළිසිඳගෙන ඇති ගන්ධබ්බයාට ද දූනෙයි.

මිනිස් ස්ත්‍රියකගේ කුස තුළ දරුවකු පිළිසිඳ ගැනීම පිළිබඳව කරුණු විමසා බැලීමේ දී අපගේ විශේෂ අවධානය යොමු කළ යුතු සූත්‍ර තුනක් පෙළ දහමෙහි හමු වේ. එනම්, මහාතණ්හාසංඛය සූත්‍රය, අස්සලායන සූත්‍රය සහ ඉන්දක සූත්‍රය යි.

මහාතණ්හාසංඛය සූත්‍රයේ දී දරුවෙකු මව්කුස පිළිසිඳ ගැනීම සඳහා අවශ්‍ය මූලික කරුණු තුනක් පෙන්වා දෙයි. ඒ අනුව, එම කරුණු තුන නම්:[1]

[1] මහාතණ්හාසංඛය සූත්‍රය, ම.නි.1, බු.ජ.මු. 622 පිට.

1. මව් පිය දෙදෙනා සංවාසයෙහි යෙදීම
2. මව ඍතුවීම
3. ගන්ධබ්බයකු පැමිණීම

තවදුරටත් කරුණු ඉදිරිපත් කරන සූත්‍රය මව්පිය දෙදෙනාගේ සංවාසය සිදු වුව ද මව ඍතු නොවන්නේ නම් ඒ හේතුවෙන් ගන්ධබ්බයකුගේ පැමිණීම සිදු නොවන නිසා එම අවස්ථාවේ දී දරුවකු මව්කුස පිළිසිඳ නොගන්නා බව පෙන්වා දෙයි.[2] එසේ ම මව්පිය දෙදෙනාගේ සංවාසයත් මව ඍතුවීමත් සිදු වුව ද ගන්ධබ්බයකුගේ පැමිණීම සිදු නොවන්නේ නම් එම අවස්ථාවේදී ද දරුවකු මව්කුස පිළිසිඳ නොගන්නා බව පෙන්වා දෙයි.[3] ඒ අනුව, පළවන හා දෙවන කරුණු සිදු වීමෙන් අනතුරුව සිදුවන ගන්ධබ්බයකුගේ පැමිණීමත් සමග දරුවකු මව්කුස පිළිසිඳ ගන්නා බව සූත්‍රය මනාව පැහැදිලි කරයි. මේ අනුව, දරුවකු මව්කුස පිළිසිඳ ගැනීම බොහෝ විට සිදුවන්නේ මවගේ ද පියාගේ ද අවබෝධයෙන් තොරව ය.

මව්කුස දරුවෙකු පිළිසිඳ ගැනීම සිදුවීම සඳහා අවශ්‍ය දෙවන කරුණ තරමක් අපහැදිලි හෙයින් ඒ සම්බන්ධව තවදුරටත් කරුණු විමසා බැලිය යුතු ය. එම කරුණ අට්ඨකථාවෙහි පැහැදිලි කොට ඇත්තේ මෙසේ ය.

''මාතා ච උතුනී හොති, මෙය ඍතු කාලය සඳහා කියන ලදී. ස්ත්‍රීන්ගේ යම් අවකාශයක දරුවා උපදී ද එහි මහත් වූ ලේ පිළාවක් පිහිටා බිඳී වැගිරෙයි. වස්තුව පිරිසිදු වෙයි. වස්තුව පිරිසිදු වූ කල්හි සත් දවස තෙක් කාලයට එයට සුදුසු කාලය වෙයි. කෙත වෙයි. ඒ කාලය තුළ ... දරුවන් හටගනී.'' [4]

මෙහි 'උතුනී හොතු' යනු මව්කුස පිරිසිදු වීමෙන් අනතුරුව එළඹෙන දින හතක කාලය යි. ඒ අනුව **උතුනී හොතු** යනු ඔසප් වීම නොවන අතර එය සිදු වී දින 5-7 කට පමණ පසුව එළඹෙන දින හතක කාලය යි. එබැවින් මෙහි **උතුනී** යන්න **සරු කාලය** යැයි ගත යුතු ය. මෙම කාලය අට්ඨකථාවේ දී උපමා කොට දක්වා ඇත්තේ බීජ වැපිරීම සඳහා සීසෑමෙන් හා පෝරු

---

යතොච බො, භික්ඛවෙ, මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති - එවං තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති.

[2] එම.
ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති මාතා ච න උතුනී හොති, ගන්ධබ්බොච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති.

[3] එම.
ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති මාතා ච උතුනී හොති, ගන්ධබ්බොච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති.

[4] මහාතණ්හාසංඛය සුත්ත වණ්ණා, පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, 2. පිට 258
**මාතාච උතුනී හොතී**ති ඉදං උතුසමයං සන්ධාය වුත්තං. මාතුගාමස්සකිර යස්මිං ඔකාසෙ දාරකො නිබ්බත්තති, තත්‍ථ මහතීලොහිතපිළකා සණ්ඨහිත්‍වා භිජ්ජිත්‍වා පග්ඝරති, වත්‍ථු සුද්ධං හොති, සුද්ධෙ වත්‍ථුම්හි මාතාපිතූසු එකවාරං සන්නිපතිතෙසු යාව සත්ත දිවසානි ඛෙත්තමෙව හොති. තස්මිං සමයෙ හත්‍ථග්ගාහවෙණිග්ගාහාදිනා අඞ්ගපරාමසනෙන පි දාරකොනිබ්බත්තියෙව.

ගැමෙන් සුදුසු පරිද්දෙන් සකස් කළ කුඹුරකට ය. මෙසේ මැනවින් සකස් වූ මව්කුසක දරුවකු පිළිසිඳ ගැනීම හෙවත් ගැබ් ගැනීම සඳහා සුදුසු කාලයක දින හතක් බව අට්ඨකථාව දක්වයි. මේ බව මනෝ විද්‍යාවට අනුව ද සනාථ කළ හැකි ය.

මවගේ ගැබ පිරිසිදු වීමෙන් (ඔසප්වීමෙන්) දින 5-7කට පමණ පසු උදාවන දිනයේ සිට එළඹෙන දින 7ක කාලය (7-14) සරු කාලය යි. එම කාලය තුළ දී සිදුවන මව්පිය දෙදෙනාගේ එකතු වීම හේතු කොට ගෙන පියාගෙන් පිටවන ශුක්‍රාණුවක් (sperm) මවගෙන් පිටවන ස්ත්‍රී බීජය (ovum) හා එකතු වෙයි. එය පිළිසිඳ ගැනීම (conception) ලෙස අර්ථ දක්වයි. පිළිසිඳ ගැනීමෙන් අනතුරුව එය යුත්තාණුවක් (zygote) බවට පත් වේ. මෙම පිළිසිඳ ගැනීම සිදු වී දින 2-6 දක්වා කාලය තුළ එම යුක්තාණුව රෝපණය වීම (implantation) සිදු වෙයි. රෝපණය වීමත් සමග එය කලලයක් (embryo) බවට පත් වේ. ෆැලෝපීය නාළය (fallopian tube) ආරම්භ වන ස්ථානයේ දී හෙවත් ස්ත්‍රී බීජය පිටවන ස්ථානයේදී ම පිළිසිඳ ගැනීම සිදුවුව හොත් එය රෝපණය වීම සඳහා දින 4-6ක කාලයක් ගත වේ. නමුත් ෆැලෝපීය නාළය අවසන් වන ස්ථානයේ හෙවත් ගර්භාෂය ආසන්නයේ දී එය සිදුවුව හොත් එය රෝපණය වීම සඳහා ගතවන්නේ පැය 48ක් හෙවත් දින දෙකක් වැනි කාලයකි. කෙසේ වුව ද යුක්තාණුවක් කලලයක් බවට පත් වීම සඳහා දින 7-10 දක්වා කාලයක් ගන්නා බව මනෝ විද්‍යාවේ දී තහවුරු කරයි.[5]

මව්පියන්ගේ එකතු වීම හේතු කොට ගෙන පිටවන ශුක්‍රාණුවක් ෆැලෝපීය නාළය ඔස්සේ ඩිම්බ පිටවන ස්ථානයට ගමන් කිරීම සඳහා දින හතරක කාලයක් ගත කරන බවත් එම කාලය තුළ එය සක්‍රීයව පවත්නා බවත් මනෝ විද්‍යාව තහවුරු කරයි.[6] එසේ ම මවගෙන් පිටවන ඩිම්බයක් ෆැලෝපීය නාළය දිගේ ගර්භාෂයට (uterus) පැමිණීම සඳහා දින දෙකක කාලයක් ගතකරන බවත් එම කාලය තුළ එය ද සක්‍රීයව පවත්නා බවත් මනෝ විද්‍යාව තහවුරු කරයි.[7] ඒ අනුව, ඩිම්බයක් පිටවීමට දින හතරකට පෙර ඇරඹෙන සරු කාලය අවසන් වන්නේ ඩිම්බය පිට වී දින දෙකකිනි. එබැවින් මෙකී කාර්ය සඳහා දින හතක කාලයක් පවතින හෙයින් මවගේ සරු කාලය (ඍතු කාලය) දින හතකි.

මව්පියන්ගේ එකතු වීමෙන් අනතුරුව සකස්වෙන සෑම යුක්තාණු හතරකින් තුනක් (75%) ම විනාශ වීමේ අවධානමකින් යුක්ත බව මනෝ විද්‍යාත්මක සාධක තහවුරු කරයි.[8] මේ සඳහා ඉවහල්වන සුවිශේෂී හේතුවක් මනෝ විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව ඉදිරිපත් නොකළ ද

---

[5] Developmental Psychology: Childhood and Adolescence, David R. Shaffer, Katherine Kipp Cengage Learning, 2009 - p. 119

> This implantation choreography takes about 48 hours and occurs 7-10 days after ovulation, with the entire process being completed about 10 to 14 days after ovulation (Hoozemanas et al., 2004).

[6] ibid., p.467

> Sperm can live in your body for approximately 4 to 5 days.

[7] ibid., p. 647

> The egg is capable of being fertilized for 12 to 48 hours before it begins to disintegrate.

[8] Developmental Psychology: Childhood and Adolescence, David R. Shaffer, Katherine Kipp Cengage Learning, 2009 - p. 122

> Nearly three zygotes out of four fail to survive the initial phase of prenatal development.

බුදුදහම ඉදිරිපත් කරයි. එනම්, ගන්ධබ්බයකුගේ නොපැමිණීම යි. ඒ අනුව පිළිවෙළින් මව්පියන්ගේ එකතු වීමත් මව ඍතු වීමත් ගන්ධබ්බයකුගේ පැමිණීමත් සිදු වේ නම් පමණක් මව ගැබ් ගැනීම සිදු වන බව තහවුරු කළ හැකි ය.

ගන්ධබ්බයාගේ පැමිණීම සම්බන්ධයෙන් අර්ථ විමසන අට්ඨකථාව ඒ පිළිබඳව මෙසේ දක්වයි. ''සත්ත්ව තෙමේ රැයක් මුළුල්ලෙහි පළමු කොට පිළිසිඳි කෙණෙහි මව්කුස වෙසේ ද, මරණයට අභිමුඛව නැගී සිටියේ ඒ මානවකයා ම ය. හෙතෙම යන්නේ ඇසිල්ලකුදු නො නවතී.''[9] ගන්ධබ්බෝ යන්නෙහි අදහස තවදුරටත් මෙසේ පැහැදිලි වෙයි. ''මව්පියන්ගේ එකතු වීම බලමින් ළඟ සිටි සත්ත්වයා මව්කුසට එළඹෙන බව නොවන්නකි. නමුත් කර්මය නැමැති යන්ත්‍රයෙන් ක්‍රියාත්මක වූ එක් සත්ත්වයෙක් ඒ අවකාශයෙහි උපදියි යන්න සිදු වන්නකි.''[10]

මින් අනතුරුව මව් කුස තුළ සිදු වන කාර්ය ඉන්ද්‍රක සූත්‍රයෙහි දක්වා ඇත. එම සූත්‍රයේ දී දරුවකු ක්ෂණිකව මව්කුසින් බිහි නොවන බවත් මව්කුස තුළ එය ක්‍රමයෙන් වර්ධනය වන බවත් විස්තර කරයි.[11] ඉන් අනතුරුව පිළිවෙළින් දරුවකු මව්කුස වර්ධනය වන්නේ කෙසේ දැයි දක්වා ඇත. එනම්ඃ

''ප්‍රථමයෙන් කලලයක් වේ. කලලයෙන් අබ්බුදය වේ. අබ්බුදයෙන් පේසිය හට ගණී. පේසියෙන් ඝන නම් මස්පිඩෙක් හට ගණී. ඒ ඝනයෙන් පිලක පසෙක් හට ගණී. ඉන් අනතුරුව කෙස් ද ලොම් ද නිය ද හට ගණී.'' [12]

මේ අනුව ගන්ධබ්බයකුගේ පැමිණීමත් සමග එය කලලයක් වන බවත් ඒ සමග ම එය මව්කුස තුළ මූලික පියවර පහකින් වර්ධනය වන බව පැහැදිලි ය.

1. කලල
2. අබ්බුද
3. පෙසි
4. ඝන
5. පසාඛ

මේ අවස්ථාවන් පහ ගතකිරීම සඳහා එකකට දින හත බැගින් දින තිස් පහක් හෙවත් සති පහක් අවශ්‍ය බව අට්ඨකථාව පෙන්වා දෙයි. බොහෝ විට මව්පියන් දරුවකු මව්කුස පිළිසඳ ගත් බව අවබෝධ කරගන්නේ මසක් ගත වූ පසුව ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් ඒ පිළිබඳව

---

[9] මහාතණ්හාසංඛය සුත්ත වණ්නා, පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, 2. පිට 258
යමෙකරත්තිං පඨමං, ගබ්භෙ වසති මාණවො
අබ්භුට්ඨිතොව සො යාති, සගච්ඡං න නිවත්ත ති

[10] එම.
ගන්ධබ්බොති තත්‍රූපගතසත්තො, පච්චුපට්ඨිතො හොතීති න මාතාපිතූනං සන්නිපාතං ඔලොකයමානො සමීපෙ ඨිතො පච්චුපට්ඨිතො නාම හොති. කම්මයන්තයන්තිතො පන එකො සත්තො තස්මිං ඔකාසෙ නිබ්බත්තනකො හොතී ති අයමෙත්ථ අධිප්පායො.

[11] ඉන්ද්‍රක සුත්ත, ස.නි. 1, පිට 336
න මාතුකුච්ඡිස්මිං එකප්පහාරෙනෙව නිබ්බත්තති, අනුපුබ්බෙන පන වඩ්ඪති

[12] එම. පඨමං කලලං හොති - කලලා හොති අබ්බුදං
අබ්බුදා ජායතෙ පෙසි - පෙසි නිබ්බත්තතී ඝනො
ඝනා පසාඛා ජායන්ති - කෙසා ලොමා නඛාපි ච

අවබෝධ කරගන්නා විට මව්කුසට පැමිණි ගන්ධබ්බයා උක්ත අවස්ථා පහ ම පසු කොට අවසන් ය.

පස්වන සතිය තවදුරටත් විස්තර කරන අටුවාව **සනා පසාකා ජායන්ති** මෙසේ දක්වයි. ''මහණෙනි, පස් වැනි සතියේ බුබුළු පහක් කර්මය හේතු කොට ගෙන පිහිටයි.'' ඉන් පසුව හය හත සති ඉක්මවා, දේශනාව සංක්ෂේප කොට, හතළිස් දෙවැනි සතියේ මේරුණු කාලය ගෙන දක්වන සේක්, **කෙසා** ආදිය පැවසූහ. ඒ අනුව හතළිස් දෙවැනි සතියේ කෙස්, ලොම්, නිය වැඩෙන බව ප්‍රකාශ කරයි. අට්ඨකථාවට අනුව දරුවකු මව්කුසින් බිහි වන්නේ සති හතළිස් දෙකකට පසුව ය. එනම් දින (42 x 7) 294 කට පමණ පසුව ය. මහාතණ්හාසංඛය සූත්‍රයට අනුව ගන්ධබ්බයා මව්කුස තුළ ගතකරන කාලය මාස නමයක්, දහයක් පමණ වේ.[13] එනම් දින 270-300 ත් අතර කාලයකි.

මව විසින් අනුභව කරන ආහාරපානාදිය අනුභව කරමින් ගන්ධබ්බයා හෙවත් මව්කුස පිළිසිඳ ගත් මිනිස් සත්ත්වයා ජීවත් වන බව මහාතණ්හාසංඛය සූත්‍රය පෙන්වා දෙයි.[14] ඒ අනුව මිනිසා විසින් අනුභව කරනු ලබන ආහාර වර්ග හතරක් දක්වා ඇත. එනම්:

1. කබලිංකාරාහාර (කැබලි වශයෙන් ගන්නා ආහාර)
2. ඵස්සාහාර (ඇස, කණ, නාසය, දිව, ශරීරය ඔස්සේ ලබන ස්පර්ශ වශයෙන් ලබා ගන්නා ආහාර)
3. මනෝසඤ්චේතනාහාර (මානසික සිතුවිලි වශයෙන් ලබා ගන්නා ආහාර)
4. විඤ්ඤාණාහාර (විඤ්ඤාණය ඔස්සේ ලබා ගන්නා ආහාර)

මේ අනුව මව්කුස හොත් බිළින්දා තමා හා තම මව ඒකාබද්ධ කොට ඇති උදර පටලය ඔස්සේ මාස දහයක කාලය තුළ මෙකී ආහාර වර්ග හතර ම ලබා ගන්නා බව අට්ඨකථාව වැඩිදුරටත් විස්තර කරයි.[15]

මෙම ලිපියේ දී මාගේ මූලික අවධානය යොමු කරන ලද්දේ මව්කුසට විඤ්ඤාණය පැමිණෙන්නේ කවදාද යන්නට පිළිතුරක් සැපයීම යි. ඇතැම් තැනෙක මෙකී විඤ්ඤාණය පැමිණෙන්නේ ඝන අවස්ථාවේ දී යැයි දක්වා තිබීම[16] මේ සඳහා ඉවහල් වූ ප්‍රධානත ම හේතුව යි. මේ අනුව මව්පියන්ගේ එකතුවීමත්, මවගේ ඍතු වීමත්, හේතුවෙන් හටගත් යුක්තාණුවට

---

[13] මහාතණ්හාසංඛය සූත්‍රය, ම.නි.1, බු.ජ.මු. 622 පිට.

මාතා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරති

[14] එම.

යඤ්චස්ස භුඤ්ජතී මාතා, අන්නං පානඤ්ච භොජනං
තෙන සො තත්ථ යාපෙති, මාතුකුච්ඡිගතො නරො

[15] යක්ඛසංයුත්ත, සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා,1. 232 පිට

තෙන සො තත්ථ යාපෙන්තීති තස්ස හි නාභිතො උට්ඨිතො නාළො මාතු උදරපටලෙන එකාබද්ධො හොති... තෙන ආහාරරසො සංසරිත්වා ආහාරසමුට්ඨානරූපං සමුට්ඨාපෙති. එවං සො දස මාසෙ යාපෙති.

[16] අනුස්සති, මහාචාර්ය ඩබ්.ඇස්. කරුණාරත්න අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, බෞද්ධ කලල විද්‍යාව, චන්ද්‍රා වික්‍රමගමගේ, 25 පිට.

විඤ්ඤාණය පැමිණීමෙන් එය කලලයක් බවට පත් වන බව මවිසින් සකාරණව සඳහන් කරන ලදී.

පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන හිමි,
බී.ඒ. ගෞරව (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), එම්.ඒ. සහ එම්ෆිල් (පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය)
කථිකාචාර්ය,
බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.